**කළුතර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

**1.** මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කළුතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබුණු රු.69,998 පිරිවැය වූ රූපවාහිනී යන්ත්‍රයක් හා පුස්තකාල පොත් තොගයක්ද 2017 වර්ෂයේ ලැබී තිබූ පරිගණක 03 ක් සහ 2015 වර්ෂයේ ලැබුණු කැබ් රථයක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ගිණුම් නිවැරදි කල යුතුවේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් මගින් ගිණුම් නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණය හිමියන් හා ප්‍රාග්ධන වියදම් රු.84,647 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී ගිණුම් නිවැරදි කල යුතුවේ. | 2019 වර්ෂයේදි නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද ස්ථාවර වත්කම් අයිතම 46 ක පිරිවැය හඳුනාගෙන වත්කම් ගිණුම්වලින් හා ස්ථාවර වත්කම් ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විකුණන ලද වත්කම්වල පිරිවැය ගිණුම්වලින් හා ලේඛනවලින් ඉවත් කළ යුතුවේ. | වත්කම් පිරිවැය හෝ මිලට ගත් දිනය පිළිබඳ හඳුනාගැනීමක් නොකරන හෙයින් ගිණුම් වලින් ඉවත් කිරීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| (iv) තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.3,558,258 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොග වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි ක්‍රමය අනුගමනය කිරිමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.37,741,517 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 3,617,888 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරිම් කල යුතුවේ. | මේ සම්බන්ධයෙන් පරික්ෂා කර ඉදිරියේදි ගිණුම නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වසර 08 ක සිට පැවත එන රු.285,883 ක් වූ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු හා වසර 02 ක සිට පැවත එන රු.9,061 ක් වූ ජාතිය ගොඩනැඟිමේ බදු 2018 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුවේ. | ශේෂ නිවැරදි කිරිමට උපදෙස් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර උපදෙස් ලැබුණු පසු නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ii) වසර 05 ක සිට පැවත එන රු.450,000 ක් වූ විරී ලාම්පු ආදායමක් සභාවට ලැබී නොතිබුණි. | ආදායම් අයකර ගැනිමට හෝ කපා හැරිමට කටයුතු කල යුතුවේ. | විරී ලාම්පු ආදායම කපා හැරීමට දැනුම් දී නොමැති නිසා කපා හැරීම් සිදු කර නොතිබූ බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.73,018,616 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | වත්කම් හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කල යුතුවේ. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවි කිරිම් මිලදී ගැනීම් සිදු කිරිමේදී මෙම ද්‍රව්‍ය වට්ටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුලත් කල බව දන්වමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | | |
| (i) 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීම් සිදු කර අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | වරිපනම් කලාපය තුල ඉදි කරන ලද නව නිවාස සඳහා වරිපනම් බදු තක්සේරු ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් තක්සේරු නිලධාරින් වෙත යොමු කර ඇත. |
| (ii) 160 වගන්තිය | | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | හිඟ වරිපනම් අය කිරීමට අවසන් පියවර වශයෙන් දේපල තහනම් කල යුතුවේ. | දේපල තහනම් කිරිමේ අවසන් ලැයිස්තු සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර හෝ වෙනත් ආකාරයකට සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන තක්සේරු කිරිමට හෝ අයිතිය තහවුරු වන ලෙස වැට මායිම් සකස් කර නාම පුවරු සවි කිරිමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන තක්සේරු කිරිම හෝ අයිතිය තහවුරු කිරිමට කටයුතු කල යුතුවේ. | සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනා ගැනීමට 2017 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලයක් පත් කොට වාර්තාවන් ලබාගෙන ඇත. 2018 වර්ෂය සඳහාද සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරිමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,507,653 | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වේ. | වසර 02 ඉක්ම වූ තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කර ඇති අතර නාගොඩ උප |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | කාර්යාලයේ ඇති වසර 02 ඉක්ම වූ මුදල් මෙම වර්ෂයේ අදායමට ගැනිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ යේ 3.9.1 වගන්තිය | 3,024,929 | ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී සමිතිවල අදාළ සුදුසුකම් පරීක්ෂා නොකර කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි. | ප්‍රජා පාදක සමිති වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී ඉහත සුදුසුකම් සලකා බැලිය යුතුවේ. | ඉහත කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීමේදී අංක 03/2012 පරිදි සමිති හැකියාව, මූල්‍ය ශක්තිය සලකා බලා ඇති අතර කමිටු නිර්දේශය මත 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු සැලසුම් කරමි. |
| (ඉ) | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2052 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 100,700 | දැන්වීම් පුවරු 60 කින් අයවිය යුතු ගාස්තු අයකර නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | දැනුවත් කිරිම මගින් දැන්වීම් පුවරු 52 මුදල් 2018 වර්ෂයේ ගෙවා ඇති අතර මුදල් නොගෙවූ පුවරු ඉවත් කිරිමට කටයුතු කරමි. |

2, මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,712,853 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,410,156 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 9,957,320 | 10,802,034 | 7,481,956 | 5,777,486 | 9,089,547 | 10,369,403 | 9,509,836 | 4,272,342 |
| (ii) | කුලී | 276,600 | 276,600 | 249,600 | 27,000 | 240,000 | 229,800 | 270,300 | 12,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,460,000 | 682,209 | 3,497,320 | - | 602,000 | 3,927,666 | 3,927,666 | - |
| (iv) | වෙනත් ආදායම් | 25,707,733 | 13,000,000 | 80,578,627 | 28,801,298 | 13,000,000 | 13,000,000 | 39,781,266 | 92,386,788 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

#### (අ) වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂය අවසානයේ පැවති රු.5,776,487 ක් වූ වරිපනම් හිඟයෙන් රු.4,390,477 ක මුදල 2019 මැයි 31 වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති හිඟ වරිපනම් ශේෂය තුල වර්ෂ 05 ට වැඩි රු.852,521 ක ශේෂයක් පැවතුනි. | හිඟ බදු ශේෂය සම්බන්ධයෙන් පනතට අනුව කටයුතු කල යුතුවේ. | දේපල තහනම් කිරිමේ නිලධාරීන් පත්කර වරිපනම් හිඟය අයකර ගැනිමට කටයුතු කරමි. |
| (iii) | ග්‍රාම සේවක වසම් 03 කට අදාල වරිපනම් ඒකක 465 කින් සමාලෝචිත වර්ෂය තුල බිල් කරන ලද ආදායම වූ රු.481,442 ක මුදලින් කිසිදු මුදලක් වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතු වේ. | පරදූව , දියගම , දොඩම්මුල්ල ප්‍රදේශ නිතරම ගං වතුරෙන් යටවන බැවින් දේශපාලන අධිකාරිය මාර්ගයෙන් වරිපනම් අයකිරිම නතර කිරිමට බලපෑම් කරනු ලබයි. කෙසේ නමුත් දේපල තහනම් කිරිමේ නිලධාරීන් පත්කර වරිපනම් බදු අයකර ගැනීමේ රතු නිවේදන නිකුත් කර දේපල තහනම් කටයුතු ආරම්භ කිරිමට තීරණය කර ඇත. |

(ආ) බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශයේ 2017 වර්ෂයේ වෙළඳ බලපත්‍ර ලබාගත් ව්‍යාපාරික ආයතන 17 ක් 2018 වර්ෂය තුළ වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | 2018 වර්ෂය තුල වෙළඳ බලපත්‍ර ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | ව්‍යාපාරික ආයතන 17 න් ව්‍යාපාර 06 ක් 2018 වර්ෂයේ ව්‍යාපාර කටයුතු සිදු කර නොමැත. |
| (ii) සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර තිබුණු හෝටල් හා ආපනශාලාවලින් සියයට එකක බලපත්‍ර ගාස්තු අයකර ගැනිමේදී හෝටල් 09 කින් වරලත් ගණකාධිකාරිවරයෙකු සහතික කරන ලද ගිණුම් ලබාගෙන නොතිබුණි. | වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ලද ගිණුම් කට්ටලය අනුව සියයට 01ක බලපත්‍ර ගාස්තු අයකල යුතුවේ. | ඉදිරියේදි වරලත් ගණකාධිකාරිවරයෙකු සහතික කරන ලද ගිණුම් කට්ටලයක් ලබාගෙන බදු අය කරන අතර එසේ නොකරන ලද සංචාරක හෝටල් සඳහා නඩු පැවරීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා<br>-----------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | සියළුම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවිමට කටයුතු කල යුතුවේ. | 2015 මැයි 28 ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතුරු ව්‍යවස්ථා 15 න් 1998 අගෝස්තු 23 ගැසට් පත්‍රයේ පල කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා 04 ක් වැළඳගෙන ඇත. ත්‍රි රෝද රථ අතුරු ව්‍යවස්ථාවක්ද පනවා ඇත. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම<br>---------------------<br>2018 වර්ෂයේ අයවැයෙන් වෙන් කරන ලද රු.මි. 107.52 ක ප්‍රතිපාදනයන් සඳහා අක්මුදල් අවශ්‍යතාවය තීරණය කර අක් මුදල් | වාර්ෂික අක්මුදල් අවශ්‍යතාවය තීරණය කර ක්‍රියාකාරි | ඉදිරියේදි නිවැරදිව ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව කාර්යයන් සිදු කරමි. |

| | | |
|---|---|---|
| සැලැස්මක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | සැලැස්මට ඇතුලත් කල යුතුවේ. | |

(ඇ) ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති
--------------------------------

| | | |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් ව්‍යාපෘති 03ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේදි ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වෙමි. |

(ඈ) කාර්යසාධන ඇගයීම
------------------------

| | | |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කර මිණුම් කිරිමේ ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය අධික්ෂණය කර මිණුම් කල යුතුවේ. | ඉදිරියේදි ප්‍රගතිය අධික්ෂණය කිරිමේ ක්‍රමවේදයන් සකස් කිරිමට කටයුතු සම්පාදනය කරමින් පවති. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

| | | |
|---|---|---|
| ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBP/4/1/2- 2018 දරන චක්‍රලේඛය අනුව නව ප්‍රතිපත්ති උපාය මාර්ග හඳුනාගෙන මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබුණ අතර අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | 2018 අයවැය ලේඛනය මගින් මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කල යුතු අතර තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කල යුතුවේ. | 2019 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මෙම වරද නිවැරදි කරන අතර 2019 වර්ෂයේ සිට 2030 දක්වා තිරසර සංවර්ධන සැලස්මක් සකස් කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගොඩ රථගාල බදුදීම සම්බන්ධයෙන් 2017 වර්ෂය අවසානයේ ලැබිය යුතු රු.970,404 ක බදු කුලී මුදල 2019 මාර්තු වන විටත් අයකර ගෙන නොතිබුණි. | රථගාල් බදු කුලිය අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | හිග මුදල් අයකර ගැනිමට නීතිමය කටයුතු කිරිමට භාර දී ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති සඳහා කම්කරුවන් 06 දෙනෙක් බඳවාගෙන | ඍජු ශ්‍රමය යටතේ ව්‍යාපෘති ඉටු කිරිමට සභාව කටයුතු කල යුතුවේ. | ව්‍යාපාති පදනම මත සේවයේ නියතු කම්කරුවන් ප්‍රිමික්ස් අංශය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියේ |

| | | |
|---|---|---|
| තිබුණ ද , සෘජු ශ්‍රම පදනම යටතේ කිසිඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | | අනුමැතිය අනුව 2019 අගෝස්තු 14 කාලය දක්වා බඳවාගෙන ඇත. |
| (ආ) වසර 09 ක කාලයකට සිට වැඩ තහනම් කර තිබුණු නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.197,060 ක් සහ මියගිය නිලධාරියෙකුගෙන් වසර 02 ක කාල සීමාවක් තිස්සේ පැවති රු.111,930 ක ණය මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | වැඩ තහනම් කල නිලධාරියාගෙන් අයවිය යුතු ශේෂය අය කර ගැනීමට නඩු පවරා ඇති අතර මියගිය නිලධාරින්ගේ හිඟ ශේෂය කලත්‍රයා විසින් ගෙවීමට එකඟ වී ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ජංගම ගිණුමේ මාසික සාමාන්‍ය ශේෂය රු.මිලියන 45 ඉක්මවා තිබු අතර , එම මුදල් මහජන අවශ්‍යතා සඳහා යොදා ගැනීමට ප්‍රමුඛතාවය දීම හෝ එසේ නැත්නම් ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර පොලී ආදායමක් ලබා ගැනීමට කටයුතු කල හැකි වුවත්, එසේ කර නොතිබුණි. | ජංගම ගිණුමේ ශේෂය මහජන අවශ්‍යතා ඉටු කිරිමට හෝ ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කල යුතුවේ. | සභාවේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති හා වත්කම් මිලදී ගැනිමේ අපේක්ෂාවෙන් අවශ්‍ය ශේෂයන් පවත්වාගෙන යන ලදි. තවද 2018 වර්ෂයේ ණයහිමි වශයෙන් රු.මි.25.25 ක මුදලක් පැවති බව වාර්තා කරමි. |

3.5 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)2017 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ රු.2,996,332 ක වියදමින් නොදිරන අපද්‍රව්‍ය රැස් කිරිම සඳහා ඉදි කල ගොඩනැගිල්ල සහ අපද්‍රව්‍ය බේල් කිරිම සඳහා 2016 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබු රු.494,500 ක් වටිනා බේලින් යන්ත්‍රය 2019 මාර්තු 31 දින වන විටත් නිශ්ක්‍රියව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනය සඳහා ගත යුතුවේ. | නොදිරන අපද්‍රව්‍ය රැස් කිරිම සඳහා ගොඩනැගිල්ල තුල බේලින් යන්ත්‍රය සවිකර අපද්‍රව්‍ය බෙල් කිරිමේ කටයුතු විධිමත්ව කරගෙන ගිය නමුත් ප්‍රදේශ වාසින්ගේ බලවත් විරෝධය මත මෙම ක්‍රියාදාමය නතර කිරිමට කටයුතු කර ඇති බව වාර්තා කරමි. |

| | | |
|---|---|---|
| (ආ) 2016 වර්ෂය අවසානයේදී මිලදී ගන්නා ලද රු.591,300 ක පිරිවැය වූ තාර බැරල් 45 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්ක්‍රිය ව වැඩ අංගනය තුල පැවතුණි. | තාර බැරල් භාවිතා කිරිමට කටයුතු කල යුතුවේ. | මෙම තාර බැරල් උපයෝගි කරගෙන 2019 ජුලි වනවිට ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත. |
| (ඇ) ණැනසල මධ්‍යස්ථානය 2017 වර්ෂයේ වසා තිබුණ ද මිලදි ගත් වත්කම් හා උපකරණ අයිතම 18 ක් නාගොඩ උප කාර්යාලයේ 2019 මාර්තු 31 වන විටත් පැවතුණි. | මිලදි ගත් වත්කම් හා උපකරණ භාවිතයට ගැනිමට කටයුතු කල යුතුවේ. | 2017 වර්ෂයේ වසා දමා තිබූ ණැනසල 2018 වර්ෂයේ නැවත නිලධාරින් බඳවාගෙන ආරම්භ කර තිබුණු අතර වඩා ජනාකීර්ණ ස්ථානයක ස්ථාපිත කිරිම සදහා දැනට වස්කඩුව නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරිමට බලාපොරොත්තු වේ. |

3.6.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු KV 12.5 ජෙනරේටරය වසරකට වඩා වැඩි කාල සිමාවක් අක්‍රිය ව පැවති අතර , එය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජෙනරේටර් යන්ත්‍රය අළුත්වැඩියා කර භාවිතා කල යුතුවේ. | පිලිතුරු ලබා දි නොතිබුණි. |
| (ආ) පුස්තකාල පොත් 772 ක් අස්ථාන ගතවීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි | අස්ථාන ගතවී ඇති පොත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ සමීක්ෂණය පවත්වා අවසන් අතර 2019 ජුලි 09 දිනැති මාසික රැස්වීමට ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. |

3.7 ප්‍රසම්පාදනය

---------------

3.7.1 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------- | ------------ | ---------------------- |
| තාර අතුරා මාර්ග සංවර්ධනය කිරිම වෙනුවෙන් ඇස්තමේන්තු අනුව වැලි , චිප් ගල් සහ තාර අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව මිලදී ගැනිම් සිදුකර මිණුම් කිරිමේ ක්‍රමවේදයක් නොමැතිව ඉදිකිරිම් කොන්ත්‍රාත් සමිති වෙත මාර්ග ඉදිකිරිම සඳහා ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් රු.1,075,730 ක් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු අනුව අමුද්‍රව්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන ඒවා මිලදි ගැනීම් හා මිනුම් කිරිමේ ක්‍රමවේදයක් සකස් කල යුතුවේ. | අමුද්‍රව්‍ය මිලදි ගෙන මිණුම් කිරිම කාර්මික නිලධාරි සිදු කරනු ලබයි. |